(2) (1) වන ඡේදයේ සඳහන් යම් කරුණක් අසා තීරණය කිරීමේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට තිබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ බලතල.

155උ. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේ ය. උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ සහ ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව සහන සලස්වා දිය යුත්තේ ය.

(3) පොලිස් නිලධරයන් බඳවා ගැනීම සහ පුහුණු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම, පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම, ජාතික අංශයේ සහ පළාත් අංශවල භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩිද්‍රව්‍ය සහ

සහ උසස් කිරීමේ දී සහ ස්ථාන මාරු කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රමිති ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලුම කාරණා සඳහා සුදුසු යයි හෝ අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් කලින් කල සලකනු ලබන පරිදි විධිවිධාන සැලැස්වීම සහ තීරණය කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු ම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කමිටු.

155උ. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ශ්‍රේණිවල පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

(3) එවැනි කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති වලට අනුකූලව විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාව විසින් කාර්ය පැවරීම.

155ඌ. (1) යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් පත් කිරීම, ඔවුන් උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ කාර්ය පටිපාටියට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

අභියාචන කිරීමේ අයිතිය.

155ඍ. (1) යම් පොලිස් නිලධරයකුගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ ඔහු සම්බන්ධ යම් විනය කාරණයක් හෝ ඔහු සේවයෙන් පහ කිරීමක් හෝ පිළිබඳව 155උ සහ 155ඌ ව්‍යවස්ථාවල සඳහන් කමිටුව හෝ පොලිස්පතිවරයා හෝ පොලිස් නිලධරයා හෝ විසින් කරනු ලැබූ නියමයකින් එකී පොලිස් නිලධරයා අතෘප්තියට පත් වේ නම් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ සහ අභියාචනයක් අසා තීරණය කිරීමේ කාර්ය පටිපාටිය හා නියමිත කාල පරිච්ඡේදය විධිමත් කරමින් කලින් කල කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව, ඒ පොලිස් නිලධරයා විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය.